# නිර්මාණ Nirmana

## ඇය ඔහුට ලියූ කවි



එක්තරා යුවතියක් ඇය පෙම් බැඳි කෙනෙකුට ලියූ කවි සිය ගණනක් අප වෙත ලැබී තිබේ.

මෙතැන් පටන් ඒ කවි ඔබගේ කාව්‍ය රසාස්වාදය සඳහා ලංකාවිත්තියෙහි පළකරන්නෙමු. මෙහිදි ඇය කවුරුද හෝ ඔහු කවුරුද යන්න වැදගත් නොවේ. මෙහිදි වැදගත් වන්නේ මේ කාන්තාව කවිය තුළින් කරන භාව ප්‍රකාශනයයි.

ඇත්තෙන්ම ඇය ප්‍රසිද්ධ කිවිඳියක් ද නොවේ. එහෙත් ඇය අසාමාන්‍ය කිවිඳියකි. ඇගේ කාව්‍ය චින්තාවට කළ හැකි උපහාරයක් වශයෙන් ඒ කවි මෙසේ අප පුවත්පතේ පළකරන්නට අදහස් කළෙමු

\- කර්තෘ

අටවක මැණික වාගෙයි නුඹ කියන් නෙමී
කිසිදා නුදුටු රුව හද තුළ හැඳින් නෙමී
දුරු රට සිටින මගෙ ගුරු හිමි වඳින් නෙමී
මරණයෙ දොරටුවෙන් යළි මම උපන් නෙමී

නිදි නැති රැයේ නුඹ ගැන සිහි කරන් නෙමී
පෙම් සුවඳින් පිරුණු ගී පද ගොතන් නෙමී
ඒ ගෙත්තමට මල් සිත්තම් අඳින් නෙමී
මේ මල් නුඹට, පිළිගනිදැයි නොදන් නෙමී

සුන්දර නයන කැල්මෙන් සිත ඔද වැඩුණු
පින්බර මුව කමල වත සිරි හද රැඳුණු
පෙම්බර ගුණ සුවඳ දැනුණා ළඟ රැඳුණු
මීන් දද හීය වැදුණා දුනු දිය ඇදුණු

ගොම්මන් අඳුර ගලනා විට සතර අතින්
විමන් දොර වසා පන්හිඳ අතට අරන්
ලියන්නට වුනේ කවි ඔබ නමට මෙවන්
සෙනෙහස නිසාමයි මුදු හදවතක උපන්

දකින දකින දන අතරේ ප්‍රිය වෙන්න
කරන කියන හොඳ සිතුවිලි ජය ගන්න
සරසවි කුමරි ඔබ සිරසේ රජ වෙන්න
තෙරුවන් බෙලෙන් ආසිරි මැද වැජ ඹෙන්න!

x x x

## තාත්තාගේ තුන්මාසේ පිංකම

එදා දුටු ඒ සුදු කමල
නැත මෙදා දිස්වුණේ ගේ දොරකඩ
දූ දරු මුනුපුරන් පිළිගන්න
පියරු තැවරු දෙකම්මුල්
නැත දිලිසුණේ එදා මෙන්.

ඔබේ අතින් විධානයෙන්
වෙනදට ගෙයි තිබුණ
ගාම්භීරත්වය පලාගොස්
අහලකවත් නැති ලෙසට.

ඒ පාලු මහගෙදර,
නැත සොඳුරු පෙර මෙන්.

කාලය බොහෝ දුර ගොසින්,
එකිනෙකාගෙන්
ඔබේ සොඳුරු මතකයන් රැගෙන.

දරාගන්නද මම කෙසේ ?
අනේ තාත්තේ !
මම ගෙදර ආවේ
තුන්මාසේ පිංකමට.

♦ ලුම්බිනී විතාන
Langley UK

## විගස එනු මැන !

දුක් සුසුම් සනහන
උණුසුම් කඳුළු පිසලන
හිසට බෝ සෙවන දෙන
නුඹයි මගෙ හිමි
දිවිය සරසන

තැළුම් කෑ හදවතට
ඔසු ගල්වනා සුවඳට
සියක් දුර ගව් සිට
සදයි රැකවරණ
මහිමි නුඹ මට

දුරින් එන වා සුළි
වැරෙන් සොලවන
දොර පියන්
අනේ මා වෙත නොඑන්
මහිමි එනතුරු
දොරට විගසින්

♦ වසන්තා කුමාරි දසනායක
කිරිඳිවැල Sri Lanka

## කෝකිල ගීතය

කපුටු හොටෙන් පොඩි කාලෙම බැට කා
කපුටු කූඩුවෙන් බිමට පතිත වී
මා පිය හවු හරණක් කිසි නැතිවම
උලා කකා තැන් තැන්වල හැංගී
ගෙවා බාල විය බියෙන් සැලි සැලී
අනන්තවූ දුක් බාධක බිඳගෙන
ගත හිත දෙක ටික ටික සවි කර ගෙන
තනියෙම ජීවිත සටනින් ජය ගෙන
ජය සෝෂා ගීතයට නගාගෙන
ගහෙන් ගහට පැන අතු අග එල්ලී
මී අඹ රසයෙන් ගත සිත පිනවා
දිව වෙන පරයන ඉමිහිරි නාදෙන්
දිව රෑ ඉමිහිරි ගීත ගයන්නේ
ගුවන් ගැබම නින්නාද කරන්නයි
අමා මිහිර මු!ළු ලොවට බෙදන්නයි
දෙනෝ දහක දෙසවන් පිනවන්නයි
මොහොතක් හෝ දුක් දොම්නස් දුරු කර
සිතට පහන් සුවයක් ගෙන දෙන්නයි
ගුටිබැට දුන් කපුටන්ගෙ හොටේ හැටි
රෑ දුටු සිහිනය මෙන් අමතක වී
මෙතුවක් විඳි දුක් දොම්නස් දුරු වී
සොම්නස පමණක් හද තුළ කැටී වී
ගිගුම් දෙවා සංගීතෙන් දෙරණත
ගුවන පිරෙන්නට මිහිර මවන්නේ
මිහිරම මු!ළු ලෝකයට බෙදන්නේ
අනන්ත දුක් විඳ පෙරුම් පුරා ගත්
බෝසත් ගුණ මහිමය පෙන්නන්නයි
කිරිකැටි වයසෙදි තමන්ට බැට දුන්
කපුටන්ටත් වෛරය නැති චිත්තේ



අවෛරි වූ මෙත් ගුණයෙන් ඉතිරී
කරුණා මුදිතා ගුණදම් මතු වී
බෝසත් ගුණයෙන් සිත ද උදම් වී
උදාන ගීයක් ගයන විලාසෙන්
ඔබ පතුරන ඉමිහිරි ගී නාදය
බුදු ගුණ කැටි වී ගිය දිව මතුරකි
දුක් දොම්නස් දුරුවන දිව ඔසුවකි
ජීවිතයේ දුක් මිහිරට හරවන
මහිම කියන මනරම් දම් දෙසුමකි
නිවනට මග පෙන්වන මිණි පහනකි
කවි සමයේ සඳහන් වෙන විධියට
බුදු සමිඳුන් සිරි සදහම් දෙසුවේ
කුරවී කෙවිල් නාදයකිනි ඉමිහිරි
එබඳු කොවුල් පරපුරකින් එන හ'
වෙන්නැති ගුවනත පැතිරී යන්නේ
ඒකයි බුදු බණ සිහියට එන්නේ
සිතද පහන් රසයකින් නිවෙන්නේ

♦ මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම
Harrow UK



## Rogue Elephant

Majestic tusked beast turned savage rogue
Long ostracized, yet strongly bonded to a herd
He doggedly stalks.

Immense body covered in festering gunshot wounds,
Blinded in one eye, marauding crops mostly at night,
Wantonly destructive.
No reprieve; his fate is sealed…..
Armed men hunt him down.

♦ Denis Jansz
London NW8



## කාසියක් නිසා !

පින් මද නිසා දුප්පත්කම උරුම කොට
මන් අද දිවි ගෙවමි සහරා කතර සිට
පුන් සඳ සුදු වළා අතරින් එබෙන විට
පන් හිඳ අතට ගන්නව කවි ලියන් නට

ද රු ව න් නොදැක සිටිනව අපි වසර ගණන්
දෙ නු ව න් හෙලූ කඳුලැලි සාගරය තරන්
පෙරුමන් පිරුව දරුවන් රජ කරනු බලන්
ගි නි ය න් ගොඩක සොයනව වෙහෙසී මසුරන්

නැසියන් නොමැති රටකය සිටින් නේ
රාසියක් පැතුම් හිස මත රඳන් නේ
වාසියක් නොමැත කිසිදා ලබන් නේ
කාසියක් නිසයි අද දුක් විඳින් නේ

♦ තිස්සමහාරාමයේ බී. එච්. ධනවතී
ජෝර්දානය Jordan

## හෙළ බස

අප බස හෙළ බස
ලොව නැගු ජය ගොස
විසිරී දස දෙස
හෙළය තැබුව උස

කවියන් ඇස ඇස
වියතුන් හිස හිස
නිබඳ වඩා තොස
සුගැයුණු හෙළ බස

අපේ උරුම රැෂ
ගෙන ගිය ලොව දෙස
අප හදවත අස
නිති වැජඹෙන බස

කන්කළු මුදු බස
හැමට මියුරු ලෙස
නිතින නමා හිස
වහරමු නිසි ලෙස

♦ අචිනි කල්හාරි ලියනඳුර
නීති පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය
Sri Lanka



## පරණ බෝඩිම

පියවර නගන්නට අපහසු පුරවරෙහී
යන්තම් පය ගහන්නට පන්නරය දිදී
ගිමන් නිවන්නට උන්නා සේ පේවී
සසර අතරමග හමුවූ නැවතුමකී

සුකිරි විළඳ රස දිවගට නොදැනුන ට
විල්ලුද යහන් නොලැබූ මුත් නිදියන් ට
නැඬුව මුත් කඳුළු වගුරා පෙනෙන්න ට
ජීවිත පොත ඇහින්දෙමි මදි නොකියන් ට

වියපත් වෙමින් අව් වැසි මැද සුළං සැරෙ න්
දිනකට සිය වරක් විවරව වැසෙන හඬි න්
දුබලවූ ගේට්ටුව එපිටින් අඩි තියමි න්
කී සීයක් දූවරු වෙනුවිණිද නුඹෙ න්

අහසින් දෙව්විමන් වූවත් පලක් නැතී
පොළවෙන් මාළිගා වූවත් නිමක් නැතී
තුන් සක්වලම රන් කහවනු කුමට වටී
නුඹ හැඟවූ ජීවිත පොත තරම් සකී

♦ කුසුමිණී කීර්ති කුමාරි
Sri Lanka

## විවාහය

කයින් නිදා සිටි මා
ඇහැ ඇරුණේ
මනසින්ය

මා දුටුවේ කුමක්ද?

මා ප්‍රිය බිරිය
සිය පළමු පෙම්වතා
අත්දෙකින් අල්ලාගෙන
පෙම්වදන් දොඩනායුරු

මම ගියෙමි ඒ වෙතට

ඔව්හු මා දෙස බලන්
"නුඹ කවුද?
අපි තවම ආදරෙයි.....!"
දෙදෙනාම කීවෝ මට
නෙත් කැළුම් බැල්මෙන්

"අපරාධයක් ළඟට
ගියේ....."
මනස මට දොස් නගයි

" මහත්තයා නැගිටින්න
කෑම ටික තිවෙනවා...."
මෙහෙකාරිය
හඬ නගයි.

♦ චන්ද්‍ර ශ්‍රී කුමාර
Sri Lanka



## ජීවිතයට ඉඩ හරින්න!

සීතල මේ අඳුරු රැයේ
මා බලන්නන ඔබ එනවද
රැහැයියනුත් පිරිවරාන
පරෙස්සමට, පමා නොකර

ඔබ එනතුරු මහ බලාන
මා උන්නේ අතැහිලි ගැණ
ඉගිලයන්න බ්‍රින්දාවට
පෙම්බර ඔබෙ අතැහිලි ගෙන

මතකද මා ඔබට කීව
ඒ සුන්දර වන ඉසව්ව
කෝකිලයන් ගීත ගයන
මල්ගොමු පිස එන මඳනල

විඳගමු අපි ඒ අසිරිය
නෙත ගත සිත ඉපිල යන්න
ආදරයෙන් මා දොවන්න
ජීවිතයට ඉඩ හරින්න

♦ සකුන්තලා ස්වර්ණමාලි එදිරිසිංහ
කිරිඳිවැල Sri Lanka

## බෝ පැලයක් සේ සිටිනු මැනවි පුත

බෝ පැලයක් සේ සිටිනු මැනවි පුත!
මතු මතුවත් බෝ පැළයක් සේ

ලුර්දාවේ මහ පුදබිම මත්තේ විවරණ ලැබුවේ
පියරජු වන්නට නුඹට පුතේ මම
මෝදුවුණා දිනයක් දිනයක් පාසා
පුතු සෙනෙහස මහද පුරා

මේ දිවි ගමනේ මුල්ම වතාවට
තාත්ත කිව්වේ මවෙත හැරී
පියෙකු නොලද දුක සංසිඳිලද පුතුනේ
පෙර සසරෙත් අප මෙලෙස සිටින්නැති
ඒකයි මෙච්චර ලොකු පුතු වූයේ

අපේ හිතේ බර පවරාගත්තේ
නුඹවම ඒ බර දරනට රිසියෙන්
එනමුදු අප ඒ බරින් ඇත්වී
නැතේ පුතේ නුඹටම බර පටවා
බෝ පැළයක් සේ සිටින් මැනවි පුත
මතු මතුවත් බෝ පැළයක් සේ!

♦ අමර ගුණසේකර France

## දිවි පාර

කොයි පැත්තෙන් පැමිණියත්
එකම පරතරයකට
ඒකාකාරීත්වයෙන්
වැලිතල් ඔස්සේ
ගංගා උඩින් - බිම් මං යටින්
තැනිතලා - ගම්තුලා
ගම් නියං - වන මැදින්
කෙත්වතු දිගේ නැවුම් සුවඳ
උකහා
කඳු නැග - පල්ලම් බැස
එක්තරා කඩ ඉමක
ගල්කණු දෙකක් ළඟ නැවතුණු
යදමින් හැදූ
පීලි දෙකක් වැන්න
අප දෙදෙනාගේ දිවි මග
කවරදාවත් එක් නොවන!

මාලපල්ලේ
♦ කුමුදු අමරසිංහ
Edmonton - London

## මින්බිරිය ගෙදර නෑ !

බෝනික්කියන් පිරිස සෙට්ය උඩ වැතිරී ලා
බලාගෙන ඉන්නවා පාලුවේ තනිවෙ ලා
ගේ පුරා විසිර තිබු ඇගේ බඩු ළංවෙ ලා
දුක් මුසුව ඉන්නවා ඈ ගමේ ගිහිල් ලා

බත් කවන වෙලාවට ගේ වටේ දුව ඇවිද
ඉඳුල් අහුලන කුරුල්ලන් රැණ අද කොහිද
ඇගේ හඬ නැති නිසා උනුත් පාලුවෙ නිදිද
අම්මාට හොරෙන් මෙහි ඇවිද යන්නට බැරිද

♦ සුමනා බටුවිට Sri Lanka